# වැවිලි අමාත්‍යාංශය

සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

## රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

## රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි රබර් සංවර්ධන නිලධාරී (දෙපාර්තමේන්තුගත) තනතුරේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ රබර් සංවර්ධන නිලධාරී (දෙපාර්තමේන්තුගත) තනතුරේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම්ලත් ලාංකික ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

**රාජකාරී ස්වභාවය -** ක්ෂේත්‍රගත රාජකාරී වේ. රබර් වගාව සිදු කෙරෙන දිස්ත්‍රික්කවල රබර් වගාව ආශ්‍රිත ක්ෂේත්‍ර රාජකාරී සඳහා බඳවා ගන්නා රබර් සංවර්ධන නිලධාරීන් යොදවනු ඇත.

මෙහි පහත සඳහන් සුදුසුකම් සියල්ලම සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් අයදුම් කරන්න.

**01. අධ්‍යාපන සුදුසුකම්**

සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම **සහ**

ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.) **සහ**

ඇ) පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය ලඝු ලේඛනය පිළිබඳ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම.

**02. වෘත්තීය සුදුසුකම්**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන ද්‍ය අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව සම්පූර්ණ කර තිබීම. (අයදුම්පත් කැඳවන දිනට සම්පූර්ණ කර තිබිය යුතුය. අපේක්ෂිත ප්‍රතිඵල මත අයදුම් කළ නොහැකිය)

**03. කායික සුදුසුකම්**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**04. වෙනත් සුදුසුකම්**

i. ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**05. වැටුප් ක්‍රමය : MN 03 –2016**

වැටුප් පරිමාණය : රු.31,040 – 10X445-11X660-10X730-10X750-57,550

**06. වයස් සීමාව : අවම. අවු 18 - උපරිම : අවු. 30**

**07. සේවා කොන්දේසි**

7.1 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට බඳවා ගන්නා අයදුම්කරුවන් යටත් වනු ඇත.

7.2 මෙම තනතුරට පත් කරනු ලබන අය අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වනු ඇත.

7.3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

7.4 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

7.5 සෙසු සියලු කොන්දේසි හා නියමයන් අදාළ බඳවා ගැනීමේ පටිපාටිය අනුව ක්‍රියාත්මක වේ.

**08. බඳවා ගැනීමේ ක්‍රමය**

8.1 ලිඛිත විභාගයක ප්‍රතිඵල මත – ජාතික වැවිලි කළමනාකරණය ආයතනය විසින් විභාගය පවත්වනු ඇත.

8.2 විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ජාතික වැවිලිකළමනාකරණ ආයතනයේ සභාපතිතුමාගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

**09. විභාග ක්‍රමය**

i. මෙම විභාගය ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සභාපතිතුමා විසින් තීරණය කරනු ලබන දිනයකදී ( 2021 වර්ෂයේදී )කොළඹ නගරයේදී පමණක් පවත්වනු ලැබේ.

ii. මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

iii. අපේක්ෂකයා විභාගයේදී පෙනී සිටින සියළුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

iv. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සභාපතිතුමා විසින් පනවන ලද නීති රීති වලටද විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සභාපතිතුමා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔබට සිදු වේ.

**10. විෂය නිර්දේශය**

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| විෂයයන් | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40% |

විභාග විෂය නිර්දේශය පහත දැක්වේ.

**බුද්ධි පරීක්ෂණය -**

දේශීය විදේශීය තොරතුරු පිළිබඳ සාමාන්‍ය දැනීම සහ අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තත්වයන්, චිත්ත විශ්ලේෂණ තත්වයන් හා තීරණ ගැනීමේ ශක්තිය පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත.මේ ප්‍රශ්න පත්‍රය බහුවරණ ක්‍රමයට ගැළපෙන ප්‍රශ්නවලින් යුක්ත වනු ඇත.

**තාක්ෂණ ප්‍රශ්න පත්‍රය**

- ➢ වැවිලි භෝග හා කෘෂිකාර්මික වගාව පිළිබඳ පොදු දැනුම.
- ➢ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පිළිබඳ සරල අවබෝධය සහ රබර් වගා ක්ෂේත්‍රය පිළිබඳ දැනුම.

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මහජනතාව වෙත ඉටු කරනු ලබන සේවාවන් සහනාධාර ක්‍රම, රබර් වගාවට සුදුසු පාරිසරික තත්ත්වය, පස, වැවෙන ප්‍රදේශ, පාංශු සංරක්ෂණය, රබර් වගා කිරීම, තවාන් පාලනය, රෝපණ ද්‍රව්‍යය, පොහොර, වල්පැළෑටි මර්දනය, රෝග හා පළිබෝධ පාලනය, කිරි කැපීමේ ක්‍රම, ෂීට් රබර් නිෂ්පාදනය, ෂීට් රබර් ශ්‍රේණිගත කිරීම, රබර් වගා කිරීම හා නිෂ්පාදනය සම්බන්ධ දැනුම හා ඒ ආශ්‍රිත සංඛ්‍යාලේඛන පිළිබඳ සරල දැනුම ආදිය පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්න පත්‍රයෙන් සිදු කෙරේ.

**11. විභාග ගාස්තු**

විභාග ගාස්තුව රු.500.00 කි. මෙම විභාග ගාස්තුව **"අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව"** නමින් බත්තරමුල්ල මහජන බැංකු ශාඛාවේ ඇති ගිණුම් අංක : 208100149027285 දරන ගිණුමට බැරවෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවීම් කර, එම බැංකු ප්‍රේෂණ පත්‍රය අයදුම්පතෙහි ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයේ නොගැලවෙනසේ අලවන්න. (රිසිට්පතේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම සුදුසුය) විභාග ගාස්තු ගෙවන ලද මහජන බැංකු ශාඛාව, ගෙවූ දිනය, මුදල අයදුම්පතෙහි අදාළ ස්ථානයෙහි සඳහන් කරන්න. කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

**12. අයදුම් කළ යුතු ක්‍රමය**

12.1 මෙම දැන්වීමේ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව අයදුම්කරුවන් විසින්,

i. අයදුම්පත්‍ර A4 ( සෙ.මී. 21X29) කඩදාසි භාවිත කරමින් අංක 01 සිට 05 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද,

ii. අංක 06 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද ඇතුළත් වන සේ අයදුම් පත්‍රය පිළියෙල කළ යුතු වන අතර ඊට අදාළ තොරතුරු තම අත්අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය.

12.2 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු, හෝ රු.41,580/=ක මාසික ඒකාබද්ධ වැටුප් තලයක් (රා.ප.ච 03/2016 I උපලේඛනය අනුව) ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

12.3 දැනටමත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

12.4 නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍ර විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරුවන් විසින් විමසා බැලිය යුතුය.ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රද, අසම්පූර්ණ ලෙස එවා ඇති අයදුම්පත්‍රද කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

12.5 ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම

ඉල්ලුම් පත්‍ර පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීති රීති අනුව යම් අයදුම්කරුවෙකු විසින් අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් , විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට හැකිය. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම ඔහු විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12.6 විභාගය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍ර **2021.10.22** දිනට හෝ එදිනට පෙර

**අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව,**
**අංක : 465, ගනහේන, බත්තරමුල්ල.**

යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් කෙළවර (ඉහළ ) විභාගයේ නම හා තනතුර ලිවිය යුතුය.

12.7 අයදුම්පතේ ඇතුළත් තොරතුරුවලට අනුව නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙත විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

12.8 ප්‍රතිඵල නිකුත් කිරීම

විභාගයේ එක් එක් විෂයය සඳහා 40% හෝ ඊට ඉහළ ලකුණු ලැබූ සමත් අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලේඛනය අධ්‍යක්ෂ ජනරාල් වෙත ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් ලබා දෙනු ඇත. එයට අමතරව ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත එක් එක් විෂයය සඳහා ලබාගත් ලකුණු ඇතුළත් ප්‍රතිඵල ලේඛනයක් පෞද්ගලිකව ලබා දෙනු ඇත.

**13. අනන්‍යතාවය**

13.1 විභාගය ආරම්භ වන දිනයේ විභාගශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයකි.

13.2 තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාගශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුය.

**මේ සඳහා 1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ**
**2. වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පිළිගැනේ.**

13.3 මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම පිළිබඳව අවසාන තීරණය රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සතුය. නිවේදනයේ විධිවිධාන අනුව සළසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීමේ / තීරණ ගැනීමේ අයිතිය රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව,**
**අංක:465, ගනහේන, බත්තරමුල්ල.**
**011- 2889447/011- 2889446**

## ආදර්ශ අයදුම් පත්‍රය

**රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ රබර් සංවර්ධන නිලධාරී (දෙපාර්තමේන්තුගත) තනතුරේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021**

**(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)**

01 භාෂා මාධ්‍යය
සිංහල 2
දෙමළ 3
ඉංග්‍රීසි 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න )

02 නම

2.1 මුලකුරු සමග නම :Mr. / Mrs. / Miss :- ........................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) උදා. GUNAWARDHANA H.M.S.K

2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ........................

2.3 සම්පූර්ණ නම ( සිංහලෙන් / දෙමළෙන් ) :- ........................

2.4 ජාතික හැඳුනුම්පත් අංකය :- ☐☐☐☐☐☐☐☐☐☐☐☐

03 3.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :- ........................

3.2 ස්ථිර ලිපිනය (සිංහලෙන් / දෙමළෙන් ) :- ........................

3.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :- ........................

3.4 දුරකථන අංකය :- ජංගම........................නිවස:-........................

04 4.1 ස්ත්‍රී / පුරුෂ භාවය :- ........................
(✓ ලකුණ යොදන්න )
:- පුරුෂ - ☐ ස්ත්‍රී - ☐

4.2 උපන් දිනය :- වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

4.3 අයදුම්පත් කැඳවන දිනට වයස : :- අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

05 5.1 අයදුම්කරු අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය :- ........................

5.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ........................

5.3 ග්‍රාම නිලධාරී කොට්ඨාසය :- ........................

06 **අධ්‍යාපන සුදුසුකම්**

6.1 අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල

වර්ෂය හා මාසය :-........................ විභාග අංකය :- ........................

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 01 | | | 06 | | |
| 02 | | | 07 | | |
| 03 | | | 08 | | |
| 04 | | | 09 | | |
| 05 | | | 10 | | |

6.2 අ.පො.ස. ( උ.පෙළ ) විභාග ප්‍රතිඵල

වර්ෂය හා මාසය :-........................ විභාග අංකය :- ........................

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

07. වෘත්තීය සුදුසුකම්

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාලසීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

08. පරිගණක සාක්ෂරතාවය :-
........................
........................

09. වෙනත් සුදුසුකම් :-
........................
........................

10. ඔබ කවරදක හෝ කවර චෝදනාවක් සඳහා හෝ උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

ඔව් ☐ නැත ☐

(අදාළ කොටුවේ √ ලකුණ යොදන්න) ( ඔව් නම් විස්තර පහත සඳහන් කරන්න)
........................

11. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

i. විභාග ගාස්තු ගෙවූ බැංකුව :- ........................ ශාඛාව :- ........................

ii. ගෙවූ දිනය :- ........................ ගෙවූ මුදල :- ........................

iii. **විභාග ගාස්තු ගෙවන ලද බැංකු ප්‍රේෂණ පත්‍රය මෙහි නොගැලවෙන සේ අලවන්න**

**12. අයදුම්කරුගේ ප්‍රකාශය**

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙම අයදුම්පතේ යම් තොරතුරක් හෝ තොරතුරු කිහිපයක් සම්පූර්ණ නොකිරීමෙන් හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තවද මේ සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි. විභාගයේ සියලුම කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි. තවද ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සභාපති විසින්, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීතිවලට සහ ප්‍රථිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවටද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මෙම තනතුරට පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

දිනය :- ........................ ........................

අයදුම්කරුගේ අත්සන

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................ මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු / ඇය මා ඉදිරිපිටදී ........................ දින ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

දිනය :- ........................ ........................

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :-........................

තනතුර :-........................

ලිපිනය :-........................

(නිල මුද්‍රාවෙන් සනාථ කරමි)

14. ආයතන ප්‍රධානියාගේ සහතිකය

ඉහත තොරතුරු සඳහන් ........................මයා / මිය / මෙනෙවිය........................ කාර්යාලයේ සේවය කරන බවද ඔහුගේ / ඇයගේ සේවය සතුටුදායක බවද නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවද එම ලදුපත අමුණා ඇති බවද, මෙම විභාගයේ ප්‍රථිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු / ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි / නොහැකි බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

දිනය :- ........................ ........................

ආයතන ප්‍රධානියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :-........................

තනතුර :- ........................

ලිපිනය :-........................